සැ.යු.- 93.07.02 වැනි දින අංක 774 දරන ගැසට් පත්‍රයේ II වැනි කොටස හා IV(අ) වැනි කොටසද පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 775 - 1993 ජූලි 09 වැනි සිකුරාදා - 1993.07.09

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස–පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... | – | තනතුරු – ඇබෑර්තු ... ... | – |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය ... | – | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | – |
| පළාත් පත්කිරීම් ආදිය ... ... | – | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | – |
| පළාත් සභා නිවේදන ... ... | 820 | බඩුබාහිරාදිය විකිණීම් ... ... | – |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... | – | තොටුපළ, රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... | – |
| | | විවිධ දැන්වීම් ... ... | – |


සැ.යු. (i) හින්දු අධ්‍යාපන මණ්ඩලය (සංශෝධන) පනත් කෙටුම්පත, 1992 ඔක්තෝබර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මජීඩියා අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත සහ මුද්දර ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත, 1993 පෙබරවාරි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

(iii) විදේශ විනිමය (සමා) පනත් කෙටුම්පත, 1993 මාර්තු මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iv) ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත සහ මහනුවර බෞද්ධ විද්‍යාපීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 1993 මාර්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

(v) පිරිවැටුම් බදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත, 1993 මාර්තු මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය හා වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාද දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාද දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය හා වේලාවන් ඊට අනුරූපව– එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් ඇතිව එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 1993 ජූලි මස 16 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 1993 ජූලි මස 02 වැනි දින දහවල් 12ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1993 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

# පළාත් සභා නිවේදන

## සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ 1992 අංක 01 දරන බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1992 ජූලි මස 07 වැනි දින.

අනුමැතිය ලැබුනේ : 1992 ජූලි මස 22 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

එම්. එම්. යූ. ධම්මික,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

## සබරගමුව පළාත් සභාව

*බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීමේ 1992 අංක 01 දරන ප්‍රඥප්තියයි*

*සබරගමුව පළාත ඇතුළත ආරම්භ වන, බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීම සඳහා සහ ඒ සේවා ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාවට හැකි කරවීම සඳහාද, 1990 අංක 3 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය අවසන් කිරීමට ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියයි*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

01. මෙම ප්‍රඥප්තිය 1992 අංක 01 දරන සබරගමුව පළාත් සභාවේ (බස්රථ මගින් මගීන් ප්‍රවාහනය කිරීමේ) ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා ගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය.

ප්‍රඥප්තිය පරිපාලනය කිරීම.

2. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා (මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් බස්රථ ප්‍රවාහන අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය යුතු අතර, මේ ප්‍රඥප්තිය සාමාන්‍යයෙන් පරිපාලනය කිරීම ඔහුට භාර වන්නේය. තවද, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පළාත් බස් රථ ප්‍රවාහන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් සහ වෙනත් නිලධරයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයාගේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, තත් කාර්යය සඳහා අධ්‍යක්ෂවරයාගේ අත්සන සහිත ලියවිල්ලකින් බලය පවරනු ලැබූ, යම් පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු විසින් හෝ වෙනත් නිලධරයකු විසින් හෝ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකිය.

නිහිපතා සේවා සඳහා මගී වාහන අවසර පත්‍ර

3.(1) මේ ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් දෙන ලද මගී සේවා අවසර පත්‍රයක බලය යටතේ හැර, මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන් පසුව, කිසිම තැනැත්තකු විසින් මෙහි (2) වන උපවගන්තියට යටත්ව, වෙන් වෙන් ගාස්තු මත, මගීන් ගෙන යාම සඳහා පළාත ඇතුළත ආරම්භ වන නිහිපතා සේවය සඳහා බස්රථ පළාත ඇතුළත යොදා නොගත යුතුය.

(2) පළාත ඇතුළත ආරම්භ වන මාර්ගයක් සම්බන්ධයෙන්, 1985 අංක 38 දරන පෞද්ගලික බස් රථ සේවා (සංශෝධන) පනතින් සංශෝධිත 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනත සහ 1990 අංක 03 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර සහ බස් රථ ධාවකයින් විසින් දැනට දරනු ලබන මාර්ග අවසර පත්‍ර මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අවසර පත්‍ර නිකුත් කරනු ලැබුවේ යම් කාල සීමාවකටද, ඒ කාල සීමාව සහ මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින සිට හයමාසයක් වූ කාල සීමාව යන දෙකෙන් අඩුකාල සීමාවක් සඳහා ඒ අවසර පත්‍ර වලංගු වන්නේය.

(3) කිසිම තැනැත්තකු විසින්, මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන්පසුව, වෙන් වෙන් ගාස්තු මත, පාරවල් ඔස්සේ මගීන් ගෙන යාමේ නිහිපතා සේවය සඳහා, බස් රථයක් නොවන වෙනත් වාහනයක් යොදා නොගත යුතුය.

(4) අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරණලද නිලධාරියකු විසින් හෝ යම් පොලිස් නිලධාරියකු විසින්, මේ ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යොදා ගනු ලැබ ඇති ඕනෑම වාහනයක් තහනම් කොට තම භාරයට ගත හැකි අතර, ඔහු ඒ වාහනය එසේ තහනම් කොට තම භාරයට ගනු ලැබුවේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල සීමාව තුළද, ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව, ඒ වාහනය ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය.

(5) යම් වාහනයක් (4) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් නඩු විභාගය අවසාන වනතුරු, ඒ වාහනය රඳවා තබන ආඥාවක් හෝ නඩුවේ කරුණු අනුව මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව ඒ වාහනය නිදහස් කරන ආඥාවක් කළ හැකි ය.

අවසරිත බස්රථ මගින් මගීන් ගෙනයාම.

4. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන මගී සේවා අවසර පත්‍රයකින් ඒ අවසර පත්‍රයේ සඳහන් මාර්ගයේ හෝ මාර්ගවල මගීන් ගෙන යාම සඳහා සේවයක් පවත්වා ගෙන යාම පිණිස, ඒ අවසර පත්‍රය දරන්නා ලියාපදිංචි අයිතිකරු වන බස් රථයක්,යොදා ගැනීමට ඒ අවසර පත්‍රය දරන්නාට අයිතිවාසිකම් ලැබෙන්නේය.

මගී වාහන අවසර පත්‍ර සඳහා ඉල්ලුම් කිරීම

5. (1) මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ආකෘතියක් අනුව විය යුතු අතර, එය බස් රථයේ ලියාපදිංචි අයිතිකරු විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්කරුවකුම විසින් (1) වැනි උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන තම ඉල්ලුම් පත්‍රය සමග, පහත දැක්වෙන විස්තර අඩංගු නියමිත ආකෘතිය අනුව වූ ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය :-

(අ) වෙන් වෙන් ගාස්තු මත, මගීන් ගෙන යාම සඳහා ඒ බස් රථය යොදා ගැනීමට අදහස් කරනු ලබන මාර්ගය හෝ මාර්ග පිළිබඳ විස්තර.

(ආ) 6 වැනි වගන්තිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා ඉල්ලා සිටින වෙනත් විස්තර.

අවසර පත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම

6. මගී සේවා අවසර පත්‍රයක් දීම සම්බන්ධයෙන් හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් හෝ එවැනි අවසර පත්‍රයක් අලුත් කිරීම සම්බන්ධයෙන් සහ අවසර පත්‍ර දෙනු ලැබිය හැක්කේ යම් මාර්ගයක් හෝ මාර්ග සඳහාද, ඒ මාර්ග සම්බන්ධයෙන් තම අභිමතය ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂවරයා විසින්, වෙන් වෙන් ගාස්තු මත, මගීන් ප්‍රවාහනය කිරීම සඳහා පහසුකම් අවශ්‍ය කරන තැනැත්තන් සහ ඒ පහසුකම් සලසන තැනැත්තන් ද ඇතුළුව, පොදු මහජනතාවගේ යහපත ගැනත්, විශේෂයෙන්ම, ඒ අභිමතය ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන කරුණු ගැනත් සැලකිල්ල දැක්විය යුතුය :-

(අ) පොදු යහපත පිණිස කොතෙක් දුරට යෝජිත පරිදි මගීන් ගෙන යාම අවශ්‍යද, යෝග්‍යද යන වග ;

(ආ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල යෝග්‍යතාව ;

(ඇ) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල හෝ ඉන් යම් මාර්ගයක දැනටමත් කොතෙක් දුරට ප්‍රමාණවත් ලෙස,මගීන් ගෙන යාමේ සේවයක් සලසා තිබේද යන වග ;

(ඈ) (ප්‍රමාණවත්, යෝග්‍ය සහ කාර්යක්ෂම සේවාවන් සැපයීම ද ඇතුළුව) රථවාහනවලට අදාළව,සමස්තයක් වශයෙන් ප්‍රදේශයේ අවශ්‍යතා සහ දුම්රිය මගින් ප්‍රවාහණය කිරීම ඇතුළුව, සියලුම ආකාරයෙන් මගීන් ප්‍රවාහණය කිරීම සම්බන්ධීකරණය කිරීම.

7. (1) යම් තැනැත්තකු විසින් නියමිත ගාස්තුව හෝ ගාස්තු අධ්‍යක්ෂවරයා වෙත ගෙවනු ලැබුවහොත් හැර, අධ්‍යක්ෂවරයා විසින් මේ ප්‍රඥප්තිය යටතේ ඒ තැනැත්තාට මගී සේවා අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

මගී සේවා අවසර පත්‍ර වලංගු කාලසීමාව

(2) සෑම මගී වාහන අවසර පත්‍රයක්ම -

(අ) නියමිත ආකෘතිය අනුව විය යුතුය ; තවද

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුවහොත් හැර, එය නිකුත් කරන ලද දින සිට මාස දොළහේ සිට මාස තිස්හයක් වූ කාල සීමාවක් වලංගුව පවතින්නේ ය.

අවසර පත්‍රයේ අනුයුක්ත කළයුතු කොන්දේසි

8. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම මගී සේවා අවසර පත්‍රයකම මහජනතාවගේ ආරක්ෂාව සහ පහසුව සැලසීම පිණිස අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන කොන්දේසි අනුයුක්ත කරනු ලැබිය යුතුය. ඒ කොන්දේසිවලට -

(අ) අය කරනු ලබන ගමන් ගාස්තු මගී සේවා අවසර පත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ සඳහන් වන ගාස්තු විය යුතු බවට ;

(ආ) අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථය අවසර පත්‍රයේ සඳහන් වන මාර්ගයෙහි හෝ මාර්ගවල ධාවනය කළයුතු බවට ;

(ඇ) (නියම කර ඇති විට ) කාල සටහනෙහි සහ ගමන් ගාස්තු චක්‍රයෙහි පිටපත්, අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථයේ රැගෙන යායුතු බවට සහ එහි තුළ ප්‍රදර්ශනය වන ලෙස තැබිය යුතු බවට ;

(ඈ) අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථය සියලු අවස්ථාවන්හිදී සුදුසු හා සේවය කළ හැකි තත්ත්වයකින් පවත්වා ගෙන යායුතු බවට ;

(ඉ) බස් රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් අඛණ්ඩව කාර්යයෙහි නිරත වන කාලය සහ ඔවුන්ගේ වැඩ කරන සහ විවේක කාලය සහ ඔවුන්ගේ වේතන සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක නියමයන් අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථයේ රියදුරු සහ කොන්දොස්තර සම්බන්ධයෙන් පිළිපදිනු ලැබිය යුතු බවට

නියම කෙරෙන කොන්දේසිද ඇතුළත් කළ හැකිය.

නිශ්චිත වශයෙන් දැක්වීම.

9. අධ්‍යක්ෂ විසින්, මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් දෙනු ලබන අවස්ථාවේ ද, යොදා ගැනීම පිණිස ඒ අවසර පත්‍රයෙන් බලය දෙනු ලබන බස් රථය, එහි හඳුනා ගැනීමේ අංකය සහ අවශ්‍ය යයි බලය ලත් තැනැත්තා සලකන වෙනත් විස්තර, ඒ අවසර පත්‍රයේ සඳහන් කිරීමෙන්, නිශ්චිත වශයෙන් ඒ අවසර පත්‍රයේ දක්වනු ලැබිය යුතුය.

විධාන නිකුත් කිරීමට අධ්‍යක්ෂවරයාට ඇති බලය.

10. මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ ඕනෑම තැනැත්තකු මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගවල විධිවිධාන පිළිපදින බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා අදහස් කරන විධාන ඒ තැනැත්තාට නිකුත් කළ හැකි අතර, ඒ විධාන නිකුත් කරනු ලැබූ තැනැත්තා විසින් ඒ විධානවල සඳහන් වන කාලය ඇතුළත, ඒ විධාන පිළිපැදිය යුතුය.

අවසර පත්‍ර පැවරිය නොහැකි බව.

11. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලැබිය නොහැකි අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශුන්‍ය හා බල රහිත වන්නේ ය.

අවසර පත්‍ර දරන්නන් විසින් විස්තරවල යම් වෙනසක් පිළිබඳව අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු බව.

12. මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි අවසර පත්‍රය දරන්නා විසින් සඳහන් කරන ලද විස්තරවල යම් වෙනසක් සිදුවූ දින සිට දින තිහක් ඇතුළත, ඒ අවසර පත්‍රය දරන්නා විසින් ඒ පිළිබඳව ලියවිල්ලකින් අධ්‍යක්ෂවරයාට දැනුම් දී, ඔහුගේ එකඟත්වය ලියවිල්ලකින් ලබා ගත යුතුය.

අවසර පත්‍රය අලුත් කිරීම.

13. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලද විට –

(අ) ඒ මගී සේවා අවසර පත්‍රය දරන්නා මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ක්‍රියා කර ඇති බවට හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ යම් වරදක් කර නොමැති බවට ; සහ

(ආ) මගී සේවා අවසර පත්‍රය දරන්නා අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවන බවට අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වුවහොත් ඔහු විසින් ඒ අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වන දින සිට එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා ඒ අවසර පත්‍රය අලුත් කළ හැකිය.

අවසර පත්‍රයක් අවලංගු කිරීම.

14 (1) මගී වාහන අවසර පත්‍රයක් දරන්නා –

(අ) මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානයක් හෝ උල්ලංඝනය කර ඇති බවට ;

(ආ) 10 වැනි වගන්තිය යටතේ ඔහුට නිකුත් කර ඇති යම් විධානයක් පිළිපැද නොමැති බවට ; හෝ

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ ඔහු විසින් යවනු ලැබූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරුවල හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඔහු දැනුවත්ව ව්‍යාජ හෝ වැරදි විස්තර සපයා ඇති බවට

අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වුවහොත් අධ්‍යක්ෂවරයා විසින් ඒ මගී වාහන අවසර පත්‍රය අවලංගු කළ හැකි ය.

(2) අධ්‍යක්ෂවරයාගේ තීරණයට විරුද්ධව අභියාචනය කිරීමේ කාලය ඉකුත් වන තුරු හෝ 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාර අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබුවහොත් , ඒ අභියාචනය පිළිබඳව සුදුස්සන් කරනු ලබන තුරු, (1) වැනි උපවගන්තිය යටතේ අවසර පත්‍රයක් අවලංගු කිරීම බලාත්මක නොවන්නේ ය.

අධ්‍යක්ෂවරයා විසින් තම තීරණය සහ එයට හේතු, ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රය දරන්නාට දැනුම් දිය යුතු බව.

15. අධ්‍යක්ෂවරයා විසින් මගී සේවා අවසර පත්‍රයක් දීම හෝ අලුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් අවසර පත්‍රයක් අවලංගු කිරීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් තම තීරණය සහ එයට හේතු, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රය දරන්නාට දැනුම් දිය යුතුය.

අභියාචනය

16 (1) (අ) මගී සේවා අවසර පත්‍රයක් දීම හෝ එය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් ; හෝ

(ආ) අවසර පත්‍රය අවලංගු කරමින්

අධ්‍යක්ෂවරයා විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ ඉල්ලුම්කරු හෝ මගී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින්, තමාට ඒ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින දාහතරක් ඇතුළත, ඒ තීරණයට විරුද්ධව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) මෙහි (1) වැනි උපවගන්තිය යටතේ යම් අභියාචනයක් ඉදිරිපත් කරන ලද විට, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් -

(අ) අභියාචනයට ඉඩ දී, අවසර පත්‍රය දෙන ලෙස හෝ අලුත් කරන ලෙස අධ්‍යක්ෂවරයාට විධාන කිරීම ; හෝ

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කිරීම

කරනු ලැබිය හැකිය.

(3) මෙහි (2) වැනි උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලැබූ ඕනෑම විධානයක් අධ්‍යක්ෂවරයා විසින් පිළිපැදිය යුතුය.

17. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ සෑම මඟී සේවා සහතිකයක්ම, ඒ සහතිකය නිකුත් කරනු ලැබුවේ යම් බස් රථයක් සම්බන්ධයෙන් ද, ඒ බස් රථයේ වින්ඩ්ස්ක්‍රීණයේ ප්‍රකටව පෙනෙන අයුරින් ප්‍රදර්ශනය කළ යුතුය. සහතිකය වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කළ යුතු බව.

18. මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ සහ තම කාර්යයන් ඉටු කිරීමේ කාර්ය සඳහා , අධ්‍යක්ෂකට අවශ්‍ය වන යම් වාර වාර්තාවක්,තොරතුරක් හෝ කරුණු පැහැදිළි කිරීම් දැන්වීමේ සඳහන් කරනු ලබන කාලය ඇතුළත සපයන ලෙස මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ මඟී සේවා අවසර පත්‍රයක් දරන්නකුට බලයලත් තැනැත්තා විසින් ලියවිල්ලකින් දැන්වීමක් දිය හැකි අතර, ඒ දැන්වීමේ නියමයන් පිළිපැදීම ඒ අවසර පත්‍රය දරන්නාගේ යුතුකම වන්නේ ය.

19. බස් රථ නැවැත්වීම සඳහා පළාත් සභාවේ ගමනාගමන අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව පළාත් පාලන ආයතන විසින් ප්‍රදේශය තුළ පොදු බස් නැවතුම් පලවල් සහ බස් නවත්වන ස්ථාන එකක් හෝ වැඩි ගණනක් සැපයිය හැකිය. බස් රථ සඳහා පොදු බස් නැවතුම් පලවල්.

20. (1) නියමිත කරුණු ලෙස මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තියෙන් බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග

(2) විශේෂයෙන් ම සහ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන සියලුම කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබිය හැකිය :-

(අ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මඟී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක රැගෙන යා යුතු පුවරු සහ සළකුණු ;

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මඟී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක රියැදුරු හෝ කොන්දොස්තර විසින් රැගෙන යා යුතු ලේඛන සහ ඒවායේ ඇතුළත් කළ යුතු විස්තර;

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මඟී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක්, එසේ යොදා ගන්නා යම් තැනැත්තෙකු විසින් පිළිපැදිය යුතු සම්මතයන්, සහ ඒ සම්මතයන් උල්ලංඝනය වන ක්‍රියා සහ අක්‍රියයන් තහනම් කිරීම ;

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මඟී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථවල ගමන් සම්බන්ධයෙන් තබා ගත යුතු වාර්තා ;

(ඉ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මඟී වාහන අවසර පත්‍ර දරන්නන් විසින් ඒ අවසර පත්‍රවල බලය යටතේ යොදා ගනු ලබන බස් රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් ලෙස සේවා නියුක්ත කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන සහ අවසාන කරන වේලාවන් සහ ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් සම්බන්ධයෙන් ඒ අවසර පත්‍ර දරන්නන් විසින් තබා ගත යුතු වාර්තා ;

(ඊ) මේ ප්‍රඥප්තිය යටතේ තබා ගනු ලබන වාර්තා සුරක්ෂිත තබා ගැනීම, නියෝගවල සඳහන් යම් බලධරයකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම හා ඒ බලධරයා විසින් ඉල්ලා සිටින ලද විට, ඒ වාර්තා එසේ පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කිරීම ;

(උ) ප්‍රාදේශීය සංගම්, දිස්ත්‍රික් සංගම්වල සහ ඒකාබද්ධ මහා සංගම්වල සහ වෙනත් යම් සංගම්වල කටයුතු පවත්වා ගෙන යාමේ ක්‍රියා පරිපාටිය සහ ඒවායේ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳ ක්‍රියා පටිපාටිය ;

(ඌ) විශේෂයෙන් ම බස් ධාවන වේලාවන් සංවිධානය කිරීම, වේලාවල් තැබීම, සහ පහසුකම් නිසි පරිදි සහ සාධාරණ ලෙස යෙදවීම සඳහා බස් නැවතුම් පලවල්, බස් නවත්වන ස්ථාන සංවිධාන කිරීම හා කළමනාකරණය කිරීම ;

(එ) කොන්දොස්තරවරුන්ට බලපත්‍ර දීම.

(3) මෙහි (1) වැනි උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම,ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) මෙහි (1) වැනි උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව ; එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතුය.

වරදවල්.

21. මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානයක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තෙක් හෝ තමා දැනුවත්ව ව්‍යාජ හෝ වැරදි විස්තර ඇතුලත් යම්වාර වාර්තාවක්, ලිඛිත තොරතුරක් හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙක් මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන්නෙකු ය.

දණ්ඩන

22. මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙකුම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට,රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් යටත් වන බව.

23. මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකුව, සාමාන්‍යාධිකාරවරයෙකුව, ලේකම්වරයකුව, හෝ ඊට සමාන වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තකුම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩල ව්‍යාපාර ආයතනයක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේ දී ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකුව සිටි සෑම තැනැත්තකු ම

වරද සිදු කරනු ලැබුවේ ඔහුගේ දැනුම හෝ අපසහායකත්වය නොමැතිව බව සහ ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සහ සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ නිසි සියලු උද්යෝගය ඔහු ක්‍රියාත්මක කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

24. 1990 අංක 03 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

25. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් සහ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඊට එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා යම් නීතියක් යටතේ ඇති කොට, පිහිටුවනු ලැබූ යම් අධිකාරයක් ද ඇතුළත් වේ ;

"බස් රථය" යන්නෙහි, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

" මගී " යන්නෙහි, මෝටර වාහන පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"නියමිත " යන්නෙන්, මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ ;

"අමාත්‍යවරයා " යන්නෙන්, පළාත් සභාවේ ගමනාගමනය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

" වෙන් වෙන් ගාස්තු " යන්නෙහි, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1992 අංක 03 දරන සබරගමු පළාතේ මුදල් සංශෝධන ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 19 වැනි දින.

අනුමතිය ලැබුනේ 1992 නොවැම්බර් මස 25 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

එම්. එම්. යූ. ධම්මික,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

### 1992 අංක 03 දරන සබරගමු පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

1. මේ ප්‍රඥප්තිය 1992 අංක 03 දරන සබරගමු පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

සබරගමු පළාතේ 1990 අංක 6 දරන මුදල් පනතේ 11 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1990 අංක 6 දරන සබරගමු පළාතේ මුදල් ප්‍රඥප්තියේ 11 වැනි වගන්තියේ අගට පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"එසේ වුවද, යම් ව්‍යාපාරයක යම් පූර්ව කාර්තුවක් සඳහා වූ පිරිවැටුම රුපියල් දශලක්ෂය ඉක්මවන අවස්ථාවකදී, තදනන්තර කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්ද පහත දැක්වෙන ආකාරයෙන් ගෙවනු ලැබිය හැකිය.

(අ) පූර්වයෙන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් තුනෙන් එකක්. මෙය ඊළඟට එළඹෙන කාර්තුවේ දෙවන මාසයේ පසළොස්වන දිනට පෙර ගෙවිය යුතුය ;

(ආ) පූර්වයෙන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් තවත් තුනෙන් එකක්. මෙය ඊළඟට එළඹෙන කාර්තුවේ තුන් වන මාසයේ පසළොස්වන දිනදී හෝ ඊට පෙර ගෙවිය යුතුය ;

(ඇ) ඊළඟට එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දේ ඉතිරි කොටස. මෙය ඒ කාර්තුව අවසාන වීමෙන් පසු එළඹෙන ප්‍රථම මාසයේ පසළොස්වන දිනට පෙර ගෙවිය යුතුය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වැනි වගන්තියේ (ඇ) ඡේදයේ "මෝටර් රථයක අයිතිය පිළිබඳව කරනු ලබන සෑම පැවරීමක් සඳහා" යන වචන වෙනුවට, "මෝටර් රථයක අයිතිය පැවරීමේ සෑම සාධන පත්‍රයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වැනි වගන්තියේ (5) වැනි ඡේදයේ (ඊ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(ඊ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනත යටතේ සපයනු ලබන නීති ආධාර මත නඩු පවරන, විත්ති වාචක ඉදිරිපත් කරන හෝ මැදිහත් වන තැනැත්තකු වීම පිණිස, එකී නීති ආධාර පණත යටතේ අනුමත කර ඇති නීති ආධාර යෝජනා ක්‍රමයේ පාලක වරයා විසින් හෝ තත් කාර්යය සඳහා යථා පරිදි ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් සහතික කරනු ලැබූ තැනැත්තකු විසින් නැතහොත් ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සියළු ලේඛන".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන් ප්‍රඥප්තියේ 40 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ, "එහෙත් එවැනි සෑම අවස්ථාවකදීම, ඒ සාධන පත්‍රය සහතික කරන නොතාරිස්වරයා විසින් ඒ හේතු ඒ සාධන පත්‍රයේ සහතික කළයුතු" යන වචන ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ, "අවලංගු කොට නොමැති අලවන මුද්දරයක්" යන වචන වෙනුවට, "අවලංගු නොකරන ලද්දා වූ අලවන මුද්දරයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වැනි වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ වැනි වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය . ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ වැනි අළුත් වගන්තිය ඇතුළත් කිරීම.

43(අ) යම් සාධන පත්‍රයක් —

(අ) පළාතේ සීමා තුළ එක් කොටසක් ද වෙනත් පළාත් එකක හෝ ඊට වැඩි ගණනක සීමා තුල අනෙක් කොටස ද පිහිටා ඇති යම් නිශ්චල දේපළක් පැවරීමට අදාළ සාධන පත්‍රයක් වන අවස්ථාවකදී, මේ ප්‍රඥප්තිය යටතේ ඒ සාධන පත්‍රය සඳහා අය කළයුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර, විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා තිබේ නම් හෝ, ඒ දේපළෙහි අනෙක් කොටස පිහිටා ඇත්තේ යම් වෙනත් පළාතක හෝ පළාත්වල සීමා තුල ද, අවස්ථාවෝචිත පරිදි, ඒ වෙනත් පළාතේ හෝ පළාත්වල මුදල් ප්‍රඥප්තිය යටතේ අය කළයුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර ඒ ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා තිබේ නම්, ඒ දේපළ සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය ; නැතහොත් "එක් පලාතකට වඩා වැඩි පළාත් ගණනක පිහිටි දේපළ සම්බන්ධයෙන් මුද්දර ගාස්තු

(ආ) එක් නිශ්චල දේපළක් හෝ එකකට වැඩි නිශ්චල දේපල සංඛ්‍යාවක් පළාතේ සීමා තුල පිහිටා ඇත්තා වූද අනෙක් දේපළ එකක් හෝ වැඩි ගණනක් වෙනත් පළාත් එකක හෝ ඊට වැඩි ගණනක සීමා තුල පිහිටා ඇත්තා වූ ද විටක ඒ දේපළ පැවරීමට අදාළ සාධන පත්‍රයක් වන අවස්ථාවකදී, මේ ප්‍රඥප්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර මේ ප්‍රඥප්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා ඇත්තේ නම් හෝ, ඒ අනෙක් දේපල පිහිටියේ යම් පළාතක හෝ පළාත්වල සීමා තුළද, ඒ අනෙක් පළාතේ හෝ පළාත්වල මුදල් ප්‍රඥප්තිය යටතේ අය කලයුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර ඒ ප්‍රඥප්තිවල විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා ඇත්තේ නම්, ඒ දේපළ සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වැනි වගන්තියේ "රුපියල් එකක මුද්දරයක් ඇලිය යුතුය." යන වචන වෙනුවට, "රුපියල් එකක මුද්දර ගැසීම හෝ එකී රුපියලක මුද්දර ගාස්තුව 40 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ දක්වා ඇති ආකාරයට නියමිත බැංකුවකට ගෙවනු ලැබිය යුතුය" යන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වැනි උපවගන්තියේ "අධිකරණයකට ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද හෝ පවරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුවද පහත දැක්වෙන කොන්දේසි මත" යන වචන වෙනුවට, "අධිකරණයක පවරන ලද යම් නීති කෘත්‍යයකදී ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුව පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන් සහ,

(ආ) ඒ වගන්තියේ (2) වැනි උපවගන්තියේ "ඒ ලේඛණයෙහි පිටපත් කළයුතුය". යන වචන වෙනුවට, "ඒ ලේඛණයෙහි පිටපත් කළයුතු අතර, ඉන්පසු ඒ ලේඛණය යථා පරිදි මුද්දර ගැසූ ලේඛණයක් ලෙස සලකනු ලැබිය යුතුය" යන වචන ආදේශ කිරීමෙන්,

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ, "මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් අන්‍යාකාර විධිවිධාන සලසා තිබේ නම්" යන වචන වෙනුවට, "මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් වෙනත් ආකාරයකට විධිවිධාන සලසා තිබේ නම්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වැනි වගන්තියේ "අයකළ යුතුව තිබුණු" යන වචනය වෙනුවට, "අයකළයුතුව තිබුණාවූ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වැනි වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

ගාස්තු ගෙවිය යුත්තේ කවුරුන් විසින් ද යන වග.

51. ඊට පටහැනිව යම් ගිවිසුමක් තිබුණහොත් මිස, පහත දැක්වෙන තැනැත්තන් විසින් මුද්දර ගාස්තුව ගෙවිය යුතුය .

(අ) පැවරීමේ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වනවිට, පැවරුම්කරු විසින් ; සහ

(ආ) වෙනත් යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වනවිට, ඒ සාධන පත්‍රය පිළියෙල කරන, ලියන හෝ ලියා අත්සන් කරන තැනැත්තා විසින්".

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තියේ, "ඔහුගේ මුද්දර ගාස්තු අයකර ගැනීමට යටත් වන සියළු ක්‍රියා" යන වචන වෙනුවට, "මේ ප්‍රඥප්තිය යටතේ කිරීමට ඔහු යටත්ව සිටියා වූ සියළු ක්‍රියා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වැනි වගන්තියේ, "මේ පනත යටතේ ඔහු යටත්ව ඇති" යන වචන වෙනුවට "මේ ප්‍රඥප්තිය යටතේ ඔහු යටත්විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ "මුද්දර ගාස්තු අය කලයුතු නම් එය සාක්ෂිවලදී" යන වචන වෙනුවට, "මුද්දර ගාස්තු අය කලයුතු වන්නේ නම් වුවද ඒ සාධන පත්‍රය සාක්ෂිවලදී" යනවචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 (3) වැනි උප වගන්තියේ (3) වැනි උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

"(4) මේ වගන්තියේ කාර්ය සඳහා, "මුද්දර" යන යෙදුමට, අලවන මුද්දරයක් හෝ ලාංඡන මුද්දරයක් හෝ 40 (2) වැනි වගන්තිය යටතේ යථා පරිදි නිකුත් කරනු ලැබූ මුද්දර ගාස්තු ගෙවූ බවට වූ සහතිකයක් ඇතුලත් වේ."

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වැනි වගන්තියෙහි අලුත් උපවගන්තියක් ඇතුලත් කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

"(3) මේ වගන්තියේ කාර්ය සඳහා "මුද්දරයක් යන යෙදුමට, යම් අලවන මුද්දරයක්, ලාංඡන මුද්දරයක් හෝ මුද්දර ගාස්තු ගෙවූ බවට 40 (2) වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇතුලත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :

(අ) එකී 68 වැනි වගන්තිය ඒ වගන්තියේ 68 (1) වැනි උප වගන්තිය ලෙස යළි අංක කිරීමෙන්,
(ආ) එසේ යළි අංක කරන ලද උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :

"(2) (1) වැනි උපවගන්තියේ කාර්ය සඳහා "මුද්දරයක්" යන යෙදුමට, යම් අලවන මුද්දරයක්, ලාංඡන මුද්දරයක් හෝ මුද්දර ගාස්තු ගෙවූ බවට 40 (2) වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇතුළත් වේ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වැනි වගන්තියේ (7) වැනි උපවගන්තියේ දැක්වෙන, "මෙහි 5 වැනි උපවගන්තියේ" යන යෙදුම වෙනුවට, " මෙහි 6 වැනි උපවගන්තියේ" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) එහි (4) වැනි උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්;

"(4) යම් සාධන පත්‍රයක් මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව 40 වන වගන්තියේ (2) වන හෝ (3) වන උපවගන්තිවල දක්වා ඇති ආකාරයට ගෙවා ඇති අවස්ථාවකදී, 40 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ බැංකුව විසින් නිකුත් කරන ලද ගෙවීම් සහතිකය ඒ සාධන පත්‍රයේ පිටපතට යථා පරිදි අලවා ඇති බව හෝ 40 වන වගන්තියේ (3) වන උපවගන්තියේ දක්වා ඇති ආකාරයට ඒ, සාධන පත්‍රය කොමසාරිස්වරයා විසින් පිටසන් කර ඇති බව, ඒ සාධන පත්‍රය සහතික කරන මහජන නොතාරිස්වරයා විසින් තම සහතිකය මගින් සහතික කළ යුතුය,"

(ආ) එකී (4) වන උපවගන්තියට ඉක්බිතිවම ඒ වගන්තියේ (5) වන උපවගන්තිය මෙන් බලපාන පරිදි පහත දැක්වෙන උපවගන්තිය එහි ඇතුලත් කිරීමෙන් ;

"(5) මේ ප්‍රඥප්තිය යටතේ මුද්දර ගාස්තු අය කරනු ලැබිය යුතු යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට, 1991 ජනවාරි 1 වන දින සිට මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය දක්වා වූ කාලය තුලදී 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන වලට හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව යථා පරිදි මුද්දර ගසා තිබේ නම්, ඒ සාධන පත්‍රය හෝ ලේඛනය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් හෝ ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතුය".

ප්‍රධාන ප්‍රඥප්තියේ xxxi වැනි පරිච්ඡේදය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ xxxi වැනි පරිච්ඡේදයේ ශීර්ෂ පාඨයේ "අධිකරණ දඩ" යන වචන වෙනුවට "අධිකරණ දඩ සහ ගාස්තු" යන වචන ආදේශ කිරීමෙන් ඒ ශීර්ෂ පාඨය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වැනි වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ : ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

"අධිකරණ දඩ.

99 (1) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් විසින් යම් ලිඛිත නීතියක් යටතේ බදු, ගාස්තු හෝ වෙනත් අය කිරීම් අයකර ගැනීම සඳහා පනවනු ලබන දඩ හැර, වැරදි සම්බන්ධයෙන් ඒ අධිකරණය විසින් පනවනු ලබන්නාවූ සහ ඒ අධිකරණය වෙත ගෙවනු ලබන්නා වූ දඩ මුදල් අතුරෙන්, යම් ලිඛිත නීතියක් ප්‍රකාර ඒ දඩ මුදල්වලින් ගෙවිය යුතුයයි අධිකරණය විසින් කරනු ලබන යම් විධානයකට යටත්ව, ඒ සියළු දඩ මුදල් පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය."

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වැනි වගන්තියේ, "ඉන් කිසිවක් සඳහා භාවිත කළයුතු ආකෘති සහ ගනුදෙනු ලේඛණය" යන වචන වෙනුවට, "ඉන් කිසිවක් සම්බන්ධයෙන් වූ ගනුදෙනු සඳහා භාවිත කළයුතු ආකෘතිපත්‍ර සහ ලේඛණය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වැනි වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 104 අ වැනි වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :- ප්‍රධාන ප්‍රඥප්තියේ 104අ වැනි වගන්තිය ඇතුළත් කිරීම.

"පළාත් දිරිගැන්වීමේ අරමුදල

104අ. (1) මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන පළාත් දිරිගැන්වීමේ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) 1991 ජනවාරි 1 වැනි දිනෙන් ආරම්භ වන වර්ෂය සම්බන්ධයෙන් පරිපූරක ආධාර මුදලක් වශයෙන් පළාත් සභාව ඉදිරියේ තබනු ලැබීමට සලස්වනු ලබන මුදල් ප්‍රමාණ සහ ඉන්පසු අරමුදලේ කාර්ය සඳහා පළාත් සභාව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන මුදල් ප්‍රමාණ අරමුදලට ගෙවනු ලැබිය යුතුය."

(3) අරමුදලින් පහත දැක්වෙන මුදල් ගෙවනු ලැබිය යුතුය :–

(අ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ ශුභ සිද්ධිය සඳහා, අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව, අවශ්‍ය වන සියළු මුදල් ; සහ

(ආ) කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් ප්‍රඥප්තියක් කාර්යක්ෂම ලෙස පරිපාලනය කරනු ලැබීම සහතික කිරීම අරභයා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ යෝජනා ක්‍රමයකට අනුකූලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ට ගෙවනු ලබන දිරි දීමනා;

(4) කොමසාරිස්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය පවරනු ලැබූ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්, නියමිත කාර්ය පරිපාටියට අනුකූලව, අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතු ය.

25. මුදල් ප්‍රඥප්තිය නමින් හැඳින්වෙන මුදල් ප්‍රඥප්තියේ සිංහල පාඨයෙහි "විකිණීම" යන වචනය සඳහන් වන කවර තැනක වුවද ඒ වෙනුවට "පැවරීම" යන වචනය ආදේශ කිරීමෙන් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන සිංහල පාඨය සංශෝධනය කිරීම.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "මේ ප්‍රඥප්තියෙහි" යන වචනය වෙනුවට,
"මේ ප්‍රඥප්තියෙහි" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "ඇලෙන මුද්දරය" යන්නෙහි අර්ථ නිරූපණයේ,
"67 (1) වන වගන්තිය" යන යෙදුම වෙනුවට
"76 (1) වන වගන්තිය" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ඇ) "තක්සේරුකරු" යන්නෙහි අර්ථ නිරූපණයෙහි
"පණතේ" යන වචනය වෙනුවට "ප්‍රඥප්තියේ"
යන වචනය ආදේශ කිරීමෙන් ;

(ඈ) "බලයලත් නියෝජිතයා" යන්නෙහි අර්ථ නිරූපණයෙහි –
(i) (1) වන ඡේදයේ "ප්‍රඥප්තියේ" යන වචනය වෙනුවට "ප්‍රඥප්තිය" යන වචනය ආදේශ කිරීමෙන් ;
(ii) එහි (2) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ;

"(2) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා තමා විසින් දෙනු ලබන බලය පැවරීමේ ලිපියෙහි නිශ්චිතව සඳහන් කරණු සම්බන්ධයෙන් තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු විසින් කලින් කල ලිඛිතව බලය පවරනු ලැබුවා වූ ද සමාගම් (විගණකවරුන්) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කර ඇති පුද්ගලයකු වන්නා වූ සහ කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබූ තැනැත්තකු වන්නා වූ හෝ දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ තැනැත්තකු වන්නා වූ ද යම් පුද්ගලයෙක් අදහස් වේ ";

(ඉ) "අයකළයුතු" යන්නෙහි අර්ථ නිරූපනයෙහි, "ලියා අත්සන් කරන ලද" යන වචන වෙනුවට, "ලියා අත්සන් කළ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) "මුද්‍රාංකනය" යන්නෙහි අර්ථ නිරූපනයේ "යම් තහඩු මුද්‍රණයක්, අකුරු ආයුධයක් හෝ උපකරණයක්" යන වචන වෙනුවට, "යම් තහඩුවක්, ප්‍රරූපයක්, මෙවලමක් හෝ උපකරණයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(උ) "ලේඛනය" යන්නෙහි අර්ථ නිරූපනයේ, "බැඳුම්කරයක් හෝ ඇප පත්‍රයක්" යන වචන වල සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ සියළු වචන ඉවත් කොට ඒ වෙනුවට, "බැඳුම්කරයක් හෝ ඇපකරයක් ඇතුළත් වේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඌ) "නිසි පරිදි මුද්දර ගසන ලද" යන්නෙහි අර්ථ නිරූපනයේ, "පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බවද" යන වචන වෙනුවට, "පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බව හෝ මුද්දර ගාස්තු ගෙවූ බව දැක්වෙන සහතිකයක් ඒ සාධන පත්‍රයට අමුණා ඇති බවද" යන වචන ආදේශ කිරීමෙන්;

(එ) "සාධන පත්‍රය" යන්නෙහි අර්ථ නිරූපනය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් ;

"සාධන පත්‍රය" යන්නට, පළාත තුළ යම් නිශ්චල දේපලක් පැවරීමට හෝ පළාත තුළදී කරනු ලබන යම් මෝටර් වාහනයක් පැවරීමට අදාළ සෑම ලේඛණයක්ම ඇතුලත් වේ ;"

(ඒ) "තැනැත්තා" යන්නෙහි අර්ථ නිරූපනයේ
"පුද්ගල මණ්ඩලයක් " යන වචන වෙනුවට
"පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඔ) "ඇටෝර්නි බලය" යන්නෙහි අර්ථ නිරූපනයේ
"තැනැත්තා වෙනුවෙන්" යන වචන වෙනුවට
"තැනැත්තා වෙනුවෙන් සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඕ) "කාර්තුව" යන්නෙහි අර්ථ නිරූපනයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන්—

"පැවරුම" යන්නෙන් විකිණීමක් අදහස් වන අතර, මියගිය තැනැත්තකුගේ බුදලයේ යම් දේපළක් ඊට ප්‍රතිලාභී හිමිකම ඇති යම් තැනැත්තකු වෙත හෝ මියගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රය යටතේ පත් කොට ඇති භාරකරුවකු වෙත, එකී මියගිය තැනැත්තාගේ බුදලයේ පොල්මෑකරුවකු නැතහොත් අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් ප්‍රතිෂ්ඨාවකින් තොරව තෑගි කිරීමක්, හුවමාරු කිරීමක් හෝ පැවරීමක් හෝ එවැනි භාරකරුවකු විසින් ප්‍රතිලාභියකු වෙත කරනු ලබන තෑගි කිරීමක් හුවමාරු කිරීමක් හෝ පැවරීමක් හෝ, මියගිය භාරකරුවකුගේ පොල්මෑකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ භාරකරුවකු විසින් උත්තරජීවී භාරකරුවකු වෙත හෝ අලුත් භාරකරුවකු වෙත ප්‍රතිෂ්ඨාවකින් තොරව කරනු ලැබූ පැවරීමක් ඇතුළත් වන අතර, පොදුවේ දරන යම් ඉඩමක් බෙදා වෙන්කර ගැනීමේ ඔප්පුවක් හෝ පැවරීම සඳහා වූ ගිවිසුමක් ඊට ඇතුලත් නොවේ ;

(ක) "භාරකරු" යන්නෙහි අර්ථ නිරූපනයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් අර්ථ නිරූපනය ඇතුලත් කිරීමෙන්: "වටිනාකම" යන්න–

(අ) තෑගි කරනු ලැබූ නිශ්චල දේපලක් නොවන යම් දේපළක් සහ යම් දිනයක් සම්බන්දයෙන් යෙදී ඇති විට, තක්සේරු කරුගේ මතය අනුව එදිනට විවෘත වෙළඳපලේදී ඒ දේපළට ලැබිය හැකි මිල ගණන වෙනස් වේ ;

(ආ) පැවරුම්කරු විසින් 1977 මාර්තු 31 වැනි දිනදී හෝ ඊට පෙර අත්කර ගන්නා ලද්දා වූ ද පසුව තෑගි කරනු ලැබුවා වූ ද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදී ඇති විට –

(i) ඒ දේපළ 1977 මාර්තු 31 වන දිනදී විකුණන ලද්දේ නම්, තක්සේරු කරුගේ මතය අනුව ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිලට, 1977 මාර්තු 31 වන දිනෙන් පසු සහ ඒ දේපළ එසේ තෑගි කළ සාධන පත්‍රයේ දිනයට පෙර ඒ දේපළට යම් වැඩිදියුණු කිරීමක්, වෙනස් කිරීමක් හෝ අමුතුවෙන් එකතු කිරීමක් කර තිබුනේ නම් ඒ සඳහා ගිය වියදම එකතු කිරීමෙන් ලැබෙන මුදල හෝ,

41

(ii) ඒ දේපළ තැගි කරන්නට යෙදුනු සාධන පත්‍රයේ දිනයේදී විවෘත වෙළඳපොලේ දී ඒ දේපළ විකුණන ලද්දේ නම්, තක්සේරුකරුගේ මතයට අනුව, ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිළ. යන දෙකින් අඩු මුදල අදහස් වේ ;

(ඇ) පැවරුම්කරු විසින් 1977 මාර්තු 31 වන දිනෙන් පසු අත්කර ගන්නා ලදුව පසුව තැගි කල යම් නිශ්චල දේපලක් සම්බන්ධයෙන් යෙදී ඇති විට —

(i) ඒ දේපළ ඒ පැවරුම්කරු විසින් අත්කර ගන්නා ලද දිනයේ දී විවෘත වෙළඳපොලේදී ඒ දේපල විකුණන ලද නම්, තක්සේරු කරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිලට, ඒ දේපළ එකී පැවරුම්කරු විසින් අත්කර ගැනීමෙන් පසු සහ ඒ දේපළ තැගි කිරීමේ සාධන පත්‍රයේ දිනයට පෙර ඒ දේපළට කරන ලද යම් වැඩිදියුණු කිරීමක්, වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් වේ නම් ඒ සඳහා ගිය වියදම එකතු කිරීමෙන් ලැබෙන මුදල ; හෝ

(ii) ඒ දේපල තැගි කරන්නට යෙදුනු සාධන පත්‍රයේ දිනයේ දී විවෘත වෙළඳපොලේදී ඒ දේපළ විකුණන ලද්දේ නම්, තක්සේරුකරුගේ මතයට අනුව, ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිළ,

යන දෙකින් අඩු මුදල අදහස් වේ".

27. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

07-209/3

---

## සබරගමුව පළාත් සභාව

### සබරගමුව පළාත් සභාවේ 1992 අංක 04 දරන ප්‍රධාන අමාත්‍ය අරමුදල ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1992 නොවැම්බර් මස 19 වැනි දින.

අනුමැතිය ලැබුනේ : 1992 නොවැම්බර් මස 25 වැනි දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

එම්. එම්. යූ. ධම්මික,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

### 1992 අංක 4 දරන සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය

*දුගී භාවයට සහන සැලසීම, අධ්‍යාපනය හෝ දැනීම නංවාලීම, ආගම නංවාලීම, පළාත සඳහා සේවය කළ තැනැත්තන්ට තෑගි ප්‍රදානය කිරීම සහ පළාතේ ජනතාවගේ යහපත හෝ අභිවෘද්ධිය සලස්වාලන වෙනත් කාර්ය සඳහා "ප්‍රධාන අමාත්‍ය අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි*

සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1992 අංක 04 දරන ප්‍රධාන අමාත්‍ය අරමුදල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන "ප්‍රධාන අමාත්‍ය අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) අරමුදල, ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, අවිච්ඡින්න පැවැත්මක් ඊට ඇත්තේය. තව ද එය විසින් පොදු මුද්‍රාවක් තබා ගැනීම කළ හැකි අතර, එකී සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකිය.

3. (1) අරමුදලේ පරිපාලනය, කළමණාකරනය සහ ප්‍රාග්ධනය මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති පරිදි සංස්ථාපනය කරනු ලබන පාලක මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතුය.

(2) මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලේ පාලක මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :-

(අ) පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා ;
(ආ) පළාත් ආණ්ඩුකාරවරයාගේ නාමිකයා ;
(ඇ) පළාතේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් ;
(ඈ) විරුද්ධ පක්ෂය විසින් නම්කරනු ලැබූ හෝ විරුද්ධ පක්ෂය නියෝජනය කරන්නා වූ ද ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු වූ ද පළාත් සභා මන්ත්‍රීවරයෙක් ;
(ඉ) පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් වර්ෂ තුනක් නොඉක්මවන කාලයකට පත්කරනු ලබන වෙනත් තැනැත්තන් දෙදෙනෙක්.

(3) (2) වැනි උප වගන්තියේ (ඈ) වැනි ඡේදය යටතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබූ යම් සාමාජිකයෙකුගේ පත්කිරීම, ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධාන ගැන නොතකා, ප්‍රධාන අමාත්‍යවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය.

(4) මණ්ඩලයේ රැස්වීම් සහ එවැනි රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකිය.

(5) මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීම හේතුකොට ගෙන ම හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීම හේතුකොට ගෙන ම මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පරිපාටියක් අවලංගු වන්නේ යයි නොසැලකිය යුතුය.

(6) ප්‍රධාන අමාත්‍යවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතුය.

4. අරමුදල පරිපාලනය කිරීමේ දී අරමුදලේ නමින් පහත දැක්වෙන බලතල මණ්ඩලය සතු වේ :-

(අ) චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම හෝ කළමණාකරනය කිරීම ;
(ආ) මණ්ඩලයට හිමිකම් ලැබෙන චංචල හෝ නිශ්චල යම් දේපළක් විකිණීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීම හෝ ඒ සම්බන්ධ කටයුතු කිරීම ;
(ඇ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සියළු ක්‍රියා සහ දේවල් කිරීම.

5. ආධාර මුදල්, පරිත්‍යාග හෝ ත්‍යාග වශයෙන් අරමුදලට ලැබෙන සියළු මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

6. "ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන ගිණුමක් මණ්ඩලය විසින් පිළිගනු ලැබූ බැංකුවක පවත්වාගෙන යා යුතු අතර, මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසු අරමුදලට උපචිත වන සියළු මුදල් ඒ ගිණුමට බැර කරනු ලැබිය යුතුය.

7. අරමුදලට අයත් මුදල් -
(අ) පළාතට සේවය කළ අය සඳහා තැගි ප්‍රදානය ;
(ආ) දුගී භාවයට සහන සැලසීම ; හෝ
(ඇ) අධ්‍යාපනය හෝ දැනීම නංවාලීම ; හෝ
(ඈ) ආගමික හා සංස්කෘතික කටයුතු නංවාලීම ;
(ඉ) පළාතේ ජනතාවගේ යහපත හා සුභ සිද්ධිය සැලසීම සඳහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට යෙදවීම

මණ්ඩලයේ කාර්ය වන්නේය.

8. අරමුදලට අයත් මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

9. පහත දැක්වෙන බලතල මණ්ඩලය සතුවේ :-

(අ) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමණාකරනය කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම;
(ආ) එසේ පත් කරනු ලැබූ නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම ;
(ඇ) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම සඳහා දරනු ලැබූ පාරිශ්‍රමික සහ වෙනත් වියදම් අරමුදලේ ආදායමින් ගෙවීම.

10. (1) අරමුදලේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියළු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමටත් වාර්ෂික ගිණුම් පිළියෙල කරවීමටත් මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතුය.

(2) විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගිණුම් වර්ෂයක් පාසා විගණනය කළ යුතුය. එකී ගිණුම් විගණනය කිරීමේ දී තමාට සහාය වීම සඳහා යම් සුදුසුකම් ලත් විගණකවරයකුගේ සේවය විගණකාධිපතිවරයා විසින් ලබා ගනු ලැබිය හැකි අතර එවැනි විගණකවරයකු විගණකාධිපතිවරයාගේ මෙහෙයුම සහ පාලනය යටතේ කටයුතු කළ යුතුය. එවැනි විගණනයක ප්‍රතිඵල අඩංගු වාර්තාවක් විගණකාධිපතිවරයා විසින් පළාත් ආණ්ඩුකාරවරයා වෙත සැපයිය යුතු අතර පළාත් ආණ්ඩුකාරවරයා විසින් ඒ වාර්තාව පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) අරමුදලේ ගිණුම් විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් දරනු ලැබූ වියදම් පියවීම පිණිස මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික, අරමුදලේ ආදායමින් විගණකාධිපතිවරයා වෙත යවනු ලැබිය යුතුය. අරමුදලෙන් විගණකාධිපතිවරයා වෙත ලැබුණු යම් පාරිශ්‍රමිකයකින් එකී විගණනය සඳහා ඔහු විසින් සේවයේ යොදවනු ලැබූ සුදුසුකම් ලත් යම් විගණකවරයකුට හෝ විගණකවරුන්ට ඔහු විසින් ගෙවනු ලැබූ මුදල් අඩු කිරීමෙන් පසු ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයකු" යන යෙදුමෙන්,

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තන් ; හෝ

(ආ) එක් එක් හේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයෙක් වන්නා වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූ ද නේවාසික හවුල් කරුවන්ගෙන් සමන්විත වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් අදහස් වේ.

11. මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පාවිච්චි කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම කෙරෙහි බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ඊට අනුෂංගික කවර වුව ද කාරණයක් සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන රීති, ඒ ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට, යටත්ව මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකිය.

07-209/4